# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2051/39 – 2017 දෙසැම්බර් 29 වැනි සිකුරාදා – 2017.12.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 345 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/514.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීඩී/බීඩී/එල්ඒඩී/3/5/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, බදුල්ල.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර (78බී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැඳලගම (කොට්ඨාස අංක 03) (බදුල්ල මහනගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/ඒසීකිව්/බීඩීඑල්/2017/161 හා 2017.07.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තොටුපොල අරාව දොඩන්ගහ අරාව – ප්‍රමාණය: හෙක්. 0.0126ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: පත්තිනි දේවාලය හිමිකම් කියන තොටුපොල අරාව දෙඩන්ගහ අරාව; දකුණට: බදුලු ඔය; බටහිරට: පත්තිනි දේවාලය හිමිකම් කියන තොටුපොල අරාව දෙඩන්ගහ අරාව.

01 - 411

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 346 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/189.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 10/3/1/3/55.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, රත්තොට.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මාතලේ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, වරාපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/ආර්ටීටී/2017/433 හා 2017.10.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – තඹලපොල හේන හෙවත් තැඹිලිපොල හේන – ප්‍රමාණය: හෙක්. 0.2401ක් පමණ**

උතුරට: රජය (මහවැලි අධිකාරිය) හිමිකම් කියන තඹලපොල හේන හෙවත් තැඹිලිපොල හේන, එස්. එම්. ජේ. එස්. සිරිවර්ධන හිමිකම් කියන තඹලපොල හේන හෙවත් තැඹිලිපොල හේන; නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන තඹලපොල හේන හෙවත් තැඹිලිපොල හේන; බටහිරට: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන තඹලපොල හේන හෙවත් තැඹිලිපොල හේන.

01 - 412

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 දෙසැම්බර් මස 09 වැනි දින අංක 1868/50 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2014 අංක 139 දරන ආඥාවේ ඇතුළත්, අංක එම්ආර්/ඩබ්ලිව්එල්ජී/2014/215 හා 2014.10.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර පී ලෙස සඳහන් ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ යොමු අංකය: 4-3/6/2014/එච්ඩබ්ලිව්/93.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඩබ්ලිව්ජී/ඉඩම්/1-1/අත්පත්/48.
2017 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ සුළු කොට්ඨාසයේ කොට්ඨාස අංක 387සී, පැලෑන උතුර, කොට්ඨාස අංක 387බී පැලෑන දකුණු ග්‍රාම නිලධාරි කොට්ඨාසවල පැලෑන උතුර, පැලෑන දකුණ සහ පොලවතුමෝදර ගම්වල පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මාර. 2644හි කැබලි අංක 26 හා 28 පිළිවෙළින් හෙක්. 0.0004 හා 0.0046 ප්‍රමාණවලින් යුත් පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 26 – විජේකෝන්වත්ත නොහොත් සෙනෙවිරත්නවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0004**

උතුරට: කැබලි අංක 25 සහ 27; නැගෙනහිරට: කැබලි අංක 27 සහ මු.පි.මාර. 74හි කැබලි අංක 13 සහ 28; දකුණට: මු.පි.මාර. 74හි කැබලි අංක 28; බටහිරට: මු.පි.මාර. 74හි කැබලි අංක 28, මාර්ගය සහ මෙම පිඹුරේ කැබලි අංක 25.

02. **කැබලි අංක 28 – විජේකෝන්වත්ත නොහොත් සෙනෙවිරත්නවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0046ක් පමණ**

උතුරට: මු.පි.මාර. 74හි කැබලි අංක 28, 13 සහ මෙම පිඹුරේ කැබලි අංක 27; නැගෙනහිරට: කැබලි අංක 27 සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අංක 29; බටහිරට: කැබලි අංක 29 සහ මු.පි.මාර. 74හි කැබලි අංක 47 සහ 28.

01 - 413

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2015 ජූනි මස 17 වැනි දින අංක 1919/38 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 120 දරන ආඥාවේ ඇතුළත්, අංක ජීඑ/බීඩීඩී/2014/1136 හා 2015.04.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර එෆ් ලෙස සඳහන් ඉඩම් කොටස සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2014/එච්ඩබ්ලිව්/288.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බීඩීඩී/එල්එන්ඩී/02/88.
2017 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගනේගම දකුණ වල්පිට උතුර යන ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ජීඒ/බීඩීඩී/2014/1136 සහ 2015.04.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් පහත නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අක්ෂර 'එෆ්' – මහවතුරාව – ප්‍රමාණය: හෙක්. 0.0062ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඊ, මාර්ගය (ප්‍රා.ස.) සහ වේරගොඩ විදනලාගේ ජිනප්‍රිය හිමිකම් කියන මහවතුරාව; නැගෙනහිරට සහ දකුණට: වේරගොඩ විදනලාගේ ජිනප්‍රිය හිමිකම් කියන මහවතුරාව; බටහිරට: වේරගොඩ විදනලාගේ ජිනප්‍රිය හිමිකම් කියන මහවතුරාව, මාර්ගය (ප්‍රා.ස.) සහ කැබලි අක්ෂර ඊ.

01 - 414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.